
# අකීකරු වඳුරු පැටියා



වෙනුලි නෙතුම්සා හරස්ගම

# අඟිකරු වඳුරු පැටියා

වෙනුලි නෙතුම්සා හරස්ගම

**ප්‍රථම මුද්‍රණය : 2023**

**කර්තෘ : වෙනුලි නෙතුම්සා හරස්ගම**

**ලිපිනය : නො.44,**
**කෙලින් වීදිය,**
**තලාතුඔය.**

**ISBN අංකය : ISBN 978-624-206-807-7**

**මුද්‍රණය**
**"PRESS"**
**නොඃ 24, කොටුගොඩැල්ල වීදිය,**
**මහනුවර.**

# පිදුම

*නිති දැනුමෙන් පෝෂණය කරන්නට වෙර දරන,*

*මාගේ සදාදරණීය විදුහල්පතිතුමිය,*

*පන්තිභාර ගුරුතුමිය,*

*ඇතුළු ගුරු මව්පියවරුන්ටත්,*

*මා පෝෂණය කරන, ඇතිදැඩි කරන*

*මාගේ මව්නි, පියාණෙනි ඔබ දෙපලටත්,*

*මා වැනිම දැනුම හඹා යන*

*මාගේ සොයුරු කැළටත්*

*මේ පොත ආදරයෙන් පුද කරමි.*

* * *

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන ''විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-01-01

ඔන්න එකෝමත් එක ගමක වඳුරු පවුලක් ජීවත් වුණා.

ඒ පවුලේ වඳුරු අම්මා, වඳුරු තාත්තා එයාලගේ වඳුරු පුතයි, වඳුරු දුවයි එක්ක සතුටින් ජීවත් වුණා.

දවසක් මේ කට්ටිය අල්ලපු ගමට කෑම හොයන්න යන්න කතා වුණා.



‘‘දුවේ, පුතේ අපි අල්ලපු ගම යනවා අපිට කෑම හොයන් එන්න. ඔය දෙන්නා අපිට නොකියා හොහෙවත් යන්න එපා. ඒ ගමේ මිනිස්සු උගුල් අටවලා තියනවා සතුන්ට. ඔයාලත් ඒවාට අහුවෙයි.’’ වඳුරු අම්මා පැටවු දෙන්නාට කිව්වා.



වඳුරු පවුල ගසින් ගසට පැන පැන අල්ලපු ගමට යන්න පිටත් වුණා. හැබැයි වඳුරු පවුලේ වඳුරු පුතා හරිම දඟයි, හිතුවක්කාරයි.



වඳුරු පුතා ගහෙන් ගහටත් පනිනවා, බිමත් දුවනවා. වඳුරු තාත්තා කොච්චර සැර කරලා කිව්වත් කියන කිසිම දෙයක් වඳුරු පුතා අහන්නේ නෑ.



ටික වෙලාවකින් වඳුරු අම්මාටයි, තාත්තාටයි වඳුරු පුතා කෑගහනවා ඇහුනා.

''අනේ අම්මේ... අනේ තාත්තේ... මාව බේරාගන්න... වඳුරු පුතා කෑ ගැසුවා.



වඳුරු අම්මායි, තාත්තායි, දුවයි හොඳටම කලබල වෙලා වඳුරු පුතාව හොයනවා.



පේන්න ගස් උඩ කොහෙවත් නෑ. වඳුරු දුවට ගස උඩ ම ඉන්න කියලා අම්මයි තාත්තයි හෙමින් හෙමින් බිමට ආවා.

මේ දෙන්නත් හරිම පරිස්සමින් වඳුරු පුතාව බිම හොයනවා.



එක පාරටම වඳුරු අම්මා දැක්කා පුතා බොරු වලකට වැටිලා ඉන්නවා. ඒක ගමේ එළවළු කොටුවලට එන ඌරන් අල්ලන්න හදපු එකක්.

වඳුරු පුතාගේ මුළු ඇගම සීරිලා ලේත් එනවා. වේදනාව ඉවසගන්න බැරුව හොඳටම අඬනවා.



වඳුරු තාත්තා වේලිලා වැටිලා තිබුණු පොල් අත්තක් අර වලට දැම්මා. වඳුරු පුතා ඒක දිගේ හෙමින් හෙමින් උඩට ආවා.

වඳුරු අම්මා දුවලා ගිහින් පුතාව තුරුල් කර ගත්තා. වඳුරු තාත්තා කිව්වා ''දෙමාපියන් කියන දේ අහන්නෙ නැති වුණාම වුණ දේ දැක්කා නේද? මීට පස්සේ හිතුවක්කාර වැඩ කරන්න එපා.'' කියලා.



වඳුරු පුතා වඳුරු අම්මාගෙනුයි, වඳුරු තාත්තාගෙනුයි සමාව ගත්තා.

එදා ඉඳලා වඳුරු පුතා හොඳ පුතෙක් වුණා.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023-11-01